# 2024 පාර්ලිමේන්තු මැතිවරණය

තැපැල් ඡන්ද විමසීම පිළිබඳ වාර්තාව

2024 නොවැම්බර් 07

PAFFREL

නිදහස් සහ සාධාරණ මැතිවරණ සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වය

නො. 16, බයර්ඩ් පෙදෙස, පාමංකඩ හරස් පාර, කොළඹ 06

+94 11 255 8570/71

paffrel@sltnet.lk

## අන්තර්ගතය

**1. පසුබිම** ........................................ 2

**2. තැපැල් ඡන්ද නිරීක්ෂණය** ........................................ 2

**3. තැපැල් ඡන්ද විමසීමේ දිනවලදී ලැබුණු පැමිණිලි** ........................................ 4

**ඇමුණුම I - 2024 ඔක්තෝබර් 30 සිට නොවැම්බර් 04 දක්වා තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමේ කාල සීමාව තුළ ලැබුණු පැමිණිලි** ........................................ 7

## රූප සටහන්

රූප සටහන 1 අබාධිත ඡන්දදායකයින් සඳහා ඡන්ද මධ්‍යස්ථානය තුළ ප්‍රවේශ පහසුකම් සලසා තිබීම ........................................ 3

රූප සටහන 2 තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීමේ කාල සීමාව තුළ පැෆ්රල් සංවිධානයට ලැබුණු මැතිවරණ පැමිණිලි ........................................ 4

## 1. පසුබිම

2024 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීම 2024 ඔක්තෝම්බර් 30, නොවැම්බර් 01 සහ නොවැම්බර් 04 යන දිනයන්හිදී සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සහ මැතිවරණ කාර්යාලවල පැවැත්විණි. 2024 ඔක්තෝබර් 30 සහ නොවැම්බර් 04 වැනි දිනයන්වලදී, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මැතිවරණ කාර්යාල සහ පොලිස්පති කාර්යාලය සඳහා තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදී තිබූ අතර, ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයින් ඇතුළු රාජ්‍ය සේවකයින් සඳහා 2024 නොවැම්බර් 01 සහ 04 යන දිනවල ඡන්දය පැවැත්විණි. මෙම නිශ්චිත දිනවලදී ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ අයවලුන් සඳහා පුද්ගලිකව ඡන්දය ප්‍රකාශ කිරීමට අමතර අවස්ථාවක් ලෙෂ 2024 නොවැම්බර් 07 සහ 08 යන දිනවල ඔවුන්ගේ අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලදී එම පහසුකම සපයනු ලබයි.

1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 26 වගන්තියේ විධිවිධාන වලට අනුව, 2024 නොවැම්බර් 14 වැනි දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේදී තැපෑලෙන් ඡන්දය දීම සඳහා වූ පහසුකම් ඉල්ලීමට හිමිකම් ඇති ඡන්ද හිමියන් වෙත එනම්, ඡන්ද විමසීමට අදාළ රාජකාරීවල නිරත වීම හෝ අනිවාර්යයෙන් පවත්වාගෙන යා යුතු වෙනත් අත්‍යවශ්‍ය සේවාවල නිරත වීම හේතුවෙන් තමාට වෙන් කරන ලද ඡන්ද පොළට පෞද්ගලිකව ගොස් ඡන්දය දීමට නොහැකි වීමට ඉඩ ඇති ඡන්ද හිමියන් සඳහා තැපෑලෙන් ඡන්දය දීම සඳහා පහසුකම් සැලසිය යුතු වේ. මැතිවරණ කොමිෂන් සභාව විසින් 2024 සැප්තැම්බර් 29 වන දින, තැපැල් ඡන්දය සඳහා අයදුම්පත් භාර ගැනීම 2024/10/01 දින ආරම්භ කරන බවත්, 2024/10/08 දිනෙන් අයදුම්පත් භාර ගැනීම අවසන් කරන බවත් ප්‍රකාශ කළේය. කෙසේ වෙතත්, නැවත වරක් මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම කාලසීමාව 2024/10/10 දින මධ්‍යම රාත්‍රිය දක්වා දීර්ඝ කරන ලදී. තැපැල් ඡන්ද හිමි නාමලේඛන සහතික කිරීම 2024/10/16 දින සිදු වූ අතර, මෙම ලැයිස්තු නිකුත් කිරීම සහ තැපැල් කාර්යාල වෙත භාරදීම 2024/10/23 දින සිදු විය.

මැතිවරණ කොමිෂන් සභාවට අනුව, ලැබුණු මුළු තැපැල් ඡන්ද අයදුම්පත් සංඛ්‍යාවෙන් (759,210) තැපැල් ඡන්ද අයදුම්පත් 21,160 ක් ප්‍රතික්ෂේප වූ අතර, එයින් 738,050 ක් පිළිගෙන ඇත. මෙවර වැඩිම පිළිගත් තැපැල් ඡන්ද අයදුම්පත් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වූ අතර, එය 78,036 කි. මුලතිව් දිස්ත්‍රික්කය අඩුමතැපැල් ඡන්ද අයදුම්පත් සංඛ්‍යාව හිමි දිස්ත්‍රික්කය වූ අතර 3,947 ක් පමණකි.

## 2. තැපැල් ඡන්ද නිරීක්ෂණය


නිදහස් හා සාමකාමී මැතිවරණයක් සහතික කිරීමේ පැෆ්රල් සංවිධානය විසින් ගනු ලබන ප්‍රයත්නයේ කොටසක් ලෙස තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමේ දිනයන්හිදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල, බස් ඩිපෝ, අධ්‍යාපන කාර්යාල, හමුදා කඳවුරු සහ පොලිස් ස්ථාන වැනි දේශපාලන වශයෙන් සංවේදී මධ්‍යස්ථානවල තැපැල් ඡන්ද නිරීක්ෂකයින් 1000ක් යොදවනු ලැබීය. මෙම නිරීක්ෂකයින් විවිධ පර්යාවලෝකයන් ඔස්සේ තැපැල් ඡන්දයේ සාධාරණත්වය තක්සේරු කිරීම සම්බන්ධයෙන් පුළුල් නිරීක්ෂණයක් පහත පැතිකඩ සම්බන්ධයෙන් සිදුකොට ඇත:

1. මැතිවරණ සූදානම
2. ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලිය
3. මැතිවරණ නීති උල්ලංඝනය කිරීම

මැතිවරණයට සූදානම් වීමේ ක්‍රියාවලියේදී, ඡන්දදායකයින්ගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ රහස්‍යභාවය ආරක්ෂාවන ලෙස ඡන්ද මධ්‍යස්ථාන සැලසුම් කිරීම පිලිබඳව නිරීක්ෂණය කරන ලදී.

තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමේ දී, නිරීක්ෂණයට ලක් කරන ලද සියලුම තැපැල් ඡන්ද මධ්‍යස්ථාන පාහේ පුද්ගලයන්ගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ රහස්‍යභාවය ආරක්ෂාවන ලෙස සකසා තිබිණි. තැපැල් ඡන්ද ක්‍රියාවලියේ විධිමත්භාවය සහතික කිරීම සඳහා අදාළ ආයතන විසින් ගන්නා ලද සවිමත් වෑයම මෙයින් පෙන්නුම් කෙරේ.

ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ප්‍රජාතන්ත්‍රවාදයේ එක් වැදගත් සහ තීරණාත්මක අංගයකි. මේ තුළ, සියල්ල ඇතුළත් මැතිවරණයක් සහතික කිරීම සඳහා මැතිවරණ කොමිසම, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන සහ අනෙකුත් අදාළ බලධාරීන් එක්ව කටයුතු කරයි. මෙම මැතිවරණය නිරීක්ෂණ ක්‍රියාවලිය තුළ විශේෂයෙන්ම ආබාධ සහිත පුද්ගලයින් සඳහා ඡන්ද මධ්‍යස්ථානවල ප්‍රවේශ පහසුකම් සැලසීම කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙම වාතාවරණය තුළ, පැෆ්රල් සංවිධානයේ තැපැල් ඡන්ද මධ්‍යස්ථාන නිරීක්ෂකයන් විසින් නිරීක්ෂණය ලක් කළ ඡන්ද මධ්‍යස්ථානවලින් 76% ක් ආබාධිත පුද්ගලයන් සඳහා ප්‍රමාණවත් පහසුකම් සපයා ඇති අතර, ඡන්ද මධ්‍යස්ථානවලින් 24% ක එම පහසුකම් සැපයීමේ යම් ඌණතාවක් පැවතී ඇත.




*රූප සටහන 1 අබාධිත ඡන්දදායකයින් සඳහා ඡන්ද මධ්‍යස්ථානය තුළ ප්‍රවේශ පහසුකම් සලසා තිබීම*

බොහෝ ඡන්ද මධ්‍යස්ථානවල පැෆ්රල් සංවිධානය මගින් යෙදවූ තැපැල් නිරීක්ෂකයින්ට අනුව, බොහෝ ඡන්ද මධ්‍යස්ථානවල සිට නිල මැතිවරණ අපේක්ෂක ලැයිස්තුව ප්‍රදර්ශනය කර නොතිබුණි. ඡන්ද මධ්‍යස්ථානවලින් 32%ක නිල දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් සහ අපේක්ෂක ලැයිස්තු ප්‍රදර්ශනයකොට ඇත.

තැපැල් ඡන්ද මධ්‍යස්ථාන තුළ දේශපාලකයන්ගේ ඡායාරූප ප්‍රදර්ශනය කර නොතිබුණි. නිරීක්ෂණය කළ පරිදි, රත්නපුර, හම්බන්තොට සහ යාපනය යන ප්‍රදේශවල පිහිටි ඡන්ද මධ්‍යස්ථාන 03කින් පමණක් දේශපාලකයන්ගේ ඡායාරූප ප්‍රදර්ශනය කර තිබීම් වාර්තා විය.

එමෙන්ම, ඡන්ද මධ්‍යස්ථාන තුළ සහ ඒ අවට පාර්ලිමේන්තු අපේක්ෂකයින්ගේ ඡායාරූප ප්‍රදර්ශනය කර තිබේද යන්න නිරීක්ෂණයේදී සොයා බැලූ අතර, ඒ අනුව වාර්තා වූයේ පුත්තලම, හම්බන්තොට, මාතර යන දිස්ත්‍රික්කවල පිහිටා තිබූ ඡන්ද මධ්‍යස්ථානවල මෙසේ පාර්ලිමේන්තු අපේක්ෂකයින්ගේ ඡායාරූප ප්‍රදර්ශනය කර තිබූ බවයි. බහුතරයක් ඡන්ද මධ්‍යස්ථානවල අපේක්ෂකයන්ගේ ඡායාරූප ප්‍රදර්ශනය කිරීම් වාර්තා වී නොමැත.

තැපැල් ඡන්ද නිරීක්ෂකයින් වාර්තා කළ පරිදී, කළුබෝවිල දකුණු කොළඹ ශික්ෂණ රෝහල සහ අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය යන ස්ථානවල පිහිටා තිබූ ඡන්ද මධ්‍යස්ථාන දෙකෙහි ඡන්දදායකයින්ගේ අනන්‍යතාවය පරීක්ෂා කර නොමැති අවස්ථා දෙකක් නිරීක්ෂණයට ලක්වී ඇත. ඉතිරි ඡන්ද මධ්‍යස්ථානවලින් 99.8% නිවැරදිව ඡන්දදායකයින්ගේ අනන්‍යතාවය පරීක්ෂා කර තහවුරු කිරීම නිසි පරිදී සිදු වී ඇත.

තැපැල් ඡන්ද නිරීක්ෂකයින් විසින් නිරීක්ෂණය කරන ලද සියලුම ඡන්ද මධ්‍යස්ථානවල ඡන්ද පත්‍රිකා ඡායාරූප ගැනීම සම්බන්ධයෙන් කිසිදු සිදුවීමක් වාර්තා වී නොමැත.

අපේක්ෂකයින් ප්‍රවර්ධනය කිරීම සඳහා ස්වකීය ඡන්ද ලකුණ ඉස්මතුවන ආකාරයේ ප්‍රවර්ධන ද්‍රව්‍ය රැගෙන ඒම නොකළ යුතු බව මැතිවරණ කොමිෂන් සභාව විසින් අවධාරණය කර ඇත. එවැනි


කටයුතු මැතිවරණයට ඉදිරිපත්වන අපේක්ෂකයින් හෝ ඔවුන්ගේ ආධාරකරුවන් විසින් ඡන්ද මධ්‍යස්ථාන තුළ සිදු කළේද යන්න නිරීක්ෂණය කළ අතර, මේ සම්බන්ධව මඩකලපුව කාත්තන්කුඩි කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයේ පිහිටි තැපැල් ඡන්ද මධ්‍යස්ථානයෙන් සිදුවීමක් වාර්තා විය. වාර්තා වූ පරිදී, නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ ආධාරකරුවන් දෙදෙනෙකු විසින් ඡන්ද මධ්‍යස්ථානය අසළ මාර්ගයේ එම දේශපාලන පක්ෂයේ අපේක්ෂකයෙකුට අදාළ අත්පත්‍රිකා බෙදාහැර ඇති අතර, පොලීසිය සිද්ධිය වූ ස්ථානයට පැමිණ, සිද්ධිය සම්බන්ධයෙන් පැමිණිල්ලක්ද ලබාගෙන ඇත.

එසේම, තැපැල් ඡන්ද මධ්‍යස්ථානවල ආරක්ෂක තත්ත්වය පිළිබඳව ද නිරීක්ෂණය කෙරිණි. නිරීක්ෂණය කළ ඡන්ද මධ්‍යස්ථානවලින් 99% කම පොලීසිය සහ ආරක්ෂක හමුදා විසින් ආරක්ෂාව සපයා තිබුණු බව වාර්තා වෙයි. වලව්වත්ත දිසා වන කාර්යාලය, මල්ලාගම් සහ තෙලිප්පලෙයිහි කොට්ඨාස අධ්‍යාපන කාර්යාල, මිනුවන්ගොඩ නගර සභාව, මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මිහින්තලේ ප්‍රාදේශීය සභාව, මිහින්තලේ පශු වෛද්‍ය කාර්යාලය, වාරියපොළ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය වැනි ස්ථානවල පිහිටි ඡන්ද මධ්‍යස්ථානවල පමණක් ඡන්ද මධ්‍යස්ථාන සඳහා ඇතුළත හෝ පිටත ආරක්ෂාවක් සපයා නොතිබුණු බව වාර්තා විය.

තැපැල් ඡන්ද නිරීක්ෂණයන්ට  අනුව, 2024 පාර්ලිමේන්තු මැතිවරණයේ තැපැල් ඡන්ද මධ්‍යස්ථානවල මැතිවරණ නීති උල්ලංඝණය කිරීමේ සිද්ධීන් වාර්තා වී ඇත්තේ සාපේක්ෂව ඉතා අල්ප වශයෙනි. මෙය නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහ පොදුවේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම පිළිබඳ කැපී පෙනෙන ලක්ෂණයකි.

## 3. තැපැල් ඡන්ද විමසීමේ දිනවලදී ලැබුණු පැමිණිලි

තැපැල් ඡන්දය පැවැත්වූ දිනවලදී පැෆ්රල් සංවිධානයේ පැමිණිලි ලැබීමේ සහ සහ අවම කිරීමේ ඒකකය වෙත පැමිණිලි කිහිපයක්ම වාර්තා විය. ඒ අනුව, ඔක්තෝබර් 30 සිට නොවැම්බර් 04 දක්වා කාලය තුළ පැමිණිලි 724 ක් වාර්තා වී ඇති අතර, ඒ අතුරින් පැමිණිලි 711 ක් තහවුරු කොටගෙන ඇත. මේ තුළ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ පැමිණිලි 08 ක්, රාජ්‍ය බලය, දේපළ සහ නිලධාරීන්  අයුතු ලෙස භාවිත කිරීම පිළිබඳ පැමිණිලි 08 ක් සහ මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි 695 ක් ඇතුළත් වේ.




*රූප සටහන 2 තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීමේ කාල සීමාව තුළ පැෆ්රල් සංවිධානයට ලැබුණු මැතිවරණ පැමිණිලි*

මෙම පැමිණිලි අතර, 2024 පාර්ලිමේන්තු මැතිවරණයේ තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමට අදාළ මැතිවරණ නීති උල්ලංඝණය කිරීම් සහ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ වැදගත් සිදුවීම් කිහිපයක් පහත පරිදි වේ.

- 2024.10.30 වැනි දින කළුතර දිස්ත්‍රික්කයෙන් මෙවර සමගි ජන බලවේගය පක්ෂයෙන් මහා මැතිවරණය සඳහා තරග වදිනු ලබන අපේක්ෂකයෙකු හට අයත් වාහන 10ක් පමණ "යුතුකමේ මනාපය" නමින් වැකි සඳහන් කර ඡන්ද පොළවල් ආශ්‍රිතව සැරිසරන බවට පැමිණිල්ලක් ලැබී ඇත.
- 2024.10.30 වැනි දින මාතර රාහුල විද්‍යාලයේ තැපැල් ඡන්ද මධ්‍යස්ථානයට ඡන්දය භාවිතා කිරීමට ගිය ඡන්ද දායකයන්ට මෙම දිනයේදී තැපැල් ඡන්දය නොපැවැත්වෙන බවට දැනුම් දී ඇති අතර, ඒ තුළින් ඔවුන් දැඩි අපහසුතාවයට පත් වූ දන්වමින් පැමිණිල්ලක් ලැබී ඇත.
- 2024.11.01 වැනි දින ගම්පහ ශ්‍රී බෝධි මාවත නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ පිහිටි ඡන්ද මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරීවරයා හා තවත් සහායිකාවක විසින් තැපැල් ඡන්ද දායකයන් හට එක්තරා පක්ෂයක නම කියමින් එම පක්ෂයට ඡන්දය ලබා දෙන ලෙසට බලපෑම් කරන බවට පැමිණිල්ලක් ලැබී ඇත.
- 2024.11.01 වැනි දින සමගි ජන බලවේගයේ පක්ෂයේ රත්නපුර දිස්ත්‍රික්කයේ මෙවර පාර්ලිමේන්තු මැතිවරණ අපේක්ෂකයකුගේ මැතිවරණ ප්‍රචාරණයට අදාළ ස්ටිකර් ඇලවූ මෝටර් රථයක් බලංගොඩ වැලිගේපොළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිහිටි තැපැල් ඡන්ද මධ්‍යස්ථානය අසල සැරිසරන බවට පැමිණිල්ලක් ලැබී ඇත.
- 2024.11.01 වැනි දින කළුතර දිස්ත්‍රික්කයෙන් මෙවර සමගි ජන බලවේගය පක්ෂයෙන් මහ මැතිවරණය සඳහා තරග වදිනු ලබන අපේක්ෂකයකුගේ මැතිවරණ ප්‍රචාරණයට අදාළ ස්ටිකර් ඇලවූ මෝටර් රථයක් උතුරු කළුතර ප්‍රදේශයේ සැරිසරන බවට පැමිණිල්ලක් ලැබී ඇත.
- 2024.11.03 වැනි දින ජයන්තිපුරත් ප්‍රදේශයේදී දෙමළ මහජන පක්ෂයේ ආධාරකරුවන් පෝස්ටර් අලවමින් සිටින අතරතුර තමිල් මක්කල් විඩුදලේ පුලිගල් පක්ෂයේ පාර්ශ්වය පැමිණ පෝස්ටර් අලවමින් සිටි පිරිසට බැණ වැදි පහර දී ඇති අතර, එහිදී දෙපාර්ශ්වය අතර ගැටුමක් ඇති වී ඇති බවට පැමිණිල්ලක් ලැබී තිබේ. එහි වැඩිදුරත් සඳහන් වන්නේ දෙමළ මහජන පක්ෂයේ ආධාරකරුවන් දෙදෙනෙක් මඩකලපුව රෝහලට ඇතුළත් කර ඇති බවත් පහර දුන් තමිල් මක්කල් විඩුදලේ පුලිගල් පක්ෂයේ දෙදෙනෙකු මේ වන විට මඩකලපුව පොලීසියට අත්අඩංගුවට ගෙන ඇති බවත් සඳහන්ය.
- 2024.11.03 වැනි දින නකල්ස් පරිසර සංවේදී කලාපයේ හෝටලයක් තුළ ඇතිවූ ආරවුලකදී පරිසරවේදියෙකුට පහරදීමේ සිද්ධියක් සම්බන්ධයෙන් සමගි ජන බලවේගයේ දඹුල්ල ආසන සංවිධායක මෙන්ම පාර්ලිමේන්තු අපේක්ෂකවරයෙකු අත්අඩංගුවට ගැනීම සඳහා විශේෂ පොලිස් කණ්ඩායමක් යොදවා ඇතැයි ලග්ගල පොලීසිය පැවසූ බවට පැමිණිල්ලක් ලැබී ඇත. (මෙම සිද්ධිය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු අපේක්ෂක දඹුල්ල ආසන සංවිධායකවරයාගේ හිතවතුන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන තිබෙන බවත් ඊට අමතරව ඔහුගේ සහෝදරයෙකුද අත්අඩංගුවට ගැනීම සඳහා පරීක්ෂණ ආරම්භ කොට ඇති බව ලග්ගල පොලීසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා සඳහන් කළ බවට තොරතුරු වාර්තා විය).
- 2024.11.04 වැනි දින මොණරාගල දිස්ත්‍රික් සමගි ජන බලවේග පාර්ලිමේන්තු මැතිවරණ අපේක්ෂකයෙකුහට දඹගල්ල ප්‍රදේශයේදී අලුයම 03 ට පමණ නාඳුනනපිරිසක් විසින් මිරිස් කුඩු ප්‍රහාරයක් සහ පහර දීමක් සිදු කර ඇත. පහර කෑමට ලක් වූ මෙම පුද්ගලයා රෝහල්ගත කර තිබෙන අතර, සැකකරුවන් පිළිබඳ පොලීසිය විසින් විමර්ශන කටයුතු ආරම්භ කර ඇත.
- 2024.11.04 දින මඩකලපුව කාත්තන්කුඩි ප්‍රදේශයේ අධ්‍යාපන කාර්යාලයේ පිහිටා ඇති තැපැල් ඡන්ද මධ්‍යස්ථානය තුළ සිය ඡන්දය භාවිතා කරන මුස්ලිම් ජාතික ඡන්ද දායකයන්ගේ ඡන්ද පත්‍රිකා ඔවුන් ඡන්දය සලකුණු කිරීමෙන් පසුව මුද්‍රා කරන නමුත් දමිළ ජාතික ඡන්ද දායකයන් තම ඡන්දය සලකුණු කළ පසුව එසේ මුද්‍රා කිරීමක් සිදු නොවන බවට පැමිණිල්ලක් ලැබී ඇති අතර පසුව දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානයේ මැදිහත්වීමෙන් එය විසඳා ඇත.

මැතිවරණ කොමිෂන් සභාව විසින් ඡන්ද මධ්‍යස්ථාන සඳහා ප්‍රමාණවත් පහසුකම් සහ සම්පත් සපයා තිබූ අතර, තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමේ දිනයන්හීදී නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහතික කිරීම සඳහා ක්‍රියාත්මක වී ඇත. ආරක්ෂිත සහ සාමකාමී ලෙස ඡන්ද මධ්‍යස්ථානවල ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුව ද ප්‍රමාණවත් ආරක්ෂාවක් සපයා ඇත. කෙසේ වෙතත්, තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් සැළකිය යුතු මට්ටමේ බලපෑමක් එල්ල විය හැකි සිදුවීම් හෝ තත්ත්වයන් වාර්තා වී නොමැත. මැතිවරණ කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා පොලීසියට අමතරව, දිවයින පුරා පිහිටි සියලුම ඡන්ද මධ්‍යස්ථානවල තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමේ දින පුරාවට මැතිවරණ කටයුතුවලට අදාළ රාජකාරිවලට සම්බන්ධ වූ සියලුම නිලධාරීන් පැෆ්රල් සංවිධානයේ පැසසුමට ලක්වේ. 2024 පාර්ලිමේන්තු මැතිවරණය පුරාවට, පැෆ්රල් සංවිධානය සිය මැතිවරණ නිරීක්ෂණ මෙහෙයුම අඛණ්ඩව සිදු කරගෙන යන අතර, සමස්ත මැතිවරණ ක්‍රියාවලියම අධීක්ෂණය කරනු ඇත.

## ඇමතුම් තොරතුරු


නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාමාර්ගය (පැෆ්රල්)
ඇමතුම් තොරතුරු
නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාමාර්ගය (පැෆ්රල්)
අංක 16, බයිර්ඩ් පෙදෙස, පාමංකඩ හරස් පාර , කොළඹ 06
දුරකථනः +94 11 255 8570
වට්සැප්: https://whatsapp.com/channel/0029Va9bCyOLI8YbWO7aaZ0r
විද්‍යුත් තැපැල් ලිපිනය : paffrel@sltnet.lk
ෆෙස්බුක්: https://www.facebook.com/Paffrel.Organization
යූටියුබ් : https://www.youtube.com/channel/UCQtjspli-nTqqTC9fq6DcQQ
වෙබ් අඩවිය: https://www.paffrel.com/paffrel/about-paffrel
ටික්ටොක්: https://www.paffrel.com/paffrel/about-paffrel
ඉන්ස්ටර්ග්‍රෑම්: https://www.instagram.com/paffrel/
ට්විටර්: https://x.com/PAFFREL
ත්‍රෙඩ්ස් : https://www.threads.net/@paffrel

## ඇමුණුම I - 2024 ඔක්තෝබර් 30 සිට නොවැම්බර් 04 දක්වා තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීමේ කාල සීමාව තුළ ලැබුණු පැමිණිලි

PAFFREL

**පාර් ලිමේන්තු මැතිවරණය 2024 - පූර්ව මැතිවරණ කාලය**

අදාල සිද්ධි වල මැතිවරණ නීති උල්ලංඝනයන් (දීප ව්‍යාප්තව)

**2024-10-30 10:00:00** සිට **2024-11-04 16:00:00** දක්වා - [පැමිණිලි ලැබුනු දිනය අනුව]

| කාණ්ඩය | සිද්ධින් වලට මැතිවරණ/අනෙකුත් නීති උල්ලංඝනයන් | තහවුරු කල | තහවුරු නොකල | එකතුව |
|---|---|---|---|---|
| 1 | මනුෂ්‍ය ඝාතන. | 0 | 0 | 0 |
| 2 | බරපතළ පහරදීම්. | 1 | 0 | 1 |
| 3 | පහරදීම්. | 2 | 0 | 2 |
| 4 | පැහැරගෙන යාම්. | 0 | 0 | 0 |
| 5 | බෝම්බ ප්‍රහාර. | 0 | 0 | 0 |
| 6 | වෙඩි තැබීම්. | 0 | 0 | 0 |
| 7 | ගිනි අවි භාවිත කර තර්ජනය කිරීම. | 0 | 0 | 0 |
| 8 | නිශ්චල දේපළ හානි කිරීම. | 0 | 0 | 0 |
| 9 | චංචල දේපල හානි කිරීම. | 0 | 0 | 0 |
| 10 | තර්ජනය කිරීම හා බිය වැද්දීම. | 3 | 1 | 4 |
| 11 | දේශපාලන පක්ෂ කාර්යාල හානි කිරීම්. | 2 | 0 | 2 |
| **ප්‍රචණ්ඩ ක්‍රියා වල එකතුව.** | | **8** | **1** | **9** |
| 12 | රාජ්‍ය බලය සහ දේපල අයුතු ලෙස භාවිතය. | 5 | 0 | 5 |
| 13 | රජයේ වාහන මැතිවරණ කටයුතු සඳහා භාවිත කිරීම. | 0 | 0 | 0 |
| 14 | රාජ්‍ය නිළධාරින්ට බලපෑම් කිරීම. | 1 | 0 | 1 |
| 15 | රාජ්‍ය නිළධාරීන් පත් කිරීම මාරු කිරීම උසස් කිරීම. | 2 | 0 | 2 |
| 16 | රාජ්‍ය නිළධාරින් සහ ආරක්ෂක අංශ දේශපාලන කටයුතු සඳහා යොදා ගැනීම . | 0 | 0 | 0 |
| 16-1 | රජයෙන් ලබාදෙන දීමනා ආධාර ද්‍රව්‍ය දේශපාලනික අර්ථයෙන් ලබාදීම. | 0 | 0 | 0 |
| **රාජ්‍ය බලය දේපළ නිළධාරීන් අයුතු ලෙස භාවිත කිරීම් වල එකතුව.** | | **8** | **0** | **8** |
| 17 | කටවුට් සැරසිලි කඩා දැමීම හා ගිනිබත් කිරීම. | 1 | 0 | 1 |
| 18 | දේශපාලන කටයුතු වලට බාධා පැමිණ වීම. | 1 | 0 | 1 |
| 19 | නීති විරෝධී ප්‍රචාරණ කටයුතු. | 570 | 4 | 574 |
| 20 | නිරීක්ෂකයන්ට තර්ජනය කිරීම් හා බාධා කිරීම. | 1 | 0 | 1 |
| 21 | රාජ්‍ය නිලධාරීන් පක්ෂග්‍රාහී ලෙස කටයුතු කිරීම සහ රාජකාරිය පැහැර හැරීම. | 3 | 1 | 4 |
| 22 | නීති විරෝධී රැස්වීම් හා පෙළපාලි. | 1 | 0 | 1 |
| 23 | නීති විරෝධී පක්ෂ කාර්යාල පවත්වාගෙන යාම. | 85 | 2 | 87 |
| 24 | දේශපාලන අරමුණු ඇතිව සංග්‍රහ කිරීම. | 25 | 5 | 30 |
| 25 | අංක තහඩු නොමැති වාහන භාවිතය. | 0 | 0 | 0 |
| 26 | ජනමාධ්‍ය පක්ෂග්‍රාහී සහ අයථා ලෙස භාවිතය. | 0 | 0 | 0 |
| 27 | ආරක්ෂක අංශ හෝ රාජ්‍ය නිළධාරීන් විසින් සිදු කරන බලපෑම්. | 0 | 0 | 0 |
| 28 | අසත්‍ය ප්‍රචාර පැතිරවීම. | 0 | 0 | 0 |
| 29 | මහජනතාවට පීඩනය වන සහ බාධා වන අයුරින් මැතිවරණ කටයුතු සිදු කිරීම සහ බලපෑම් කිරීම. | 3 | 0 | 3 |
| 30 | ඡන්ද දායකයින්ට බලපෑම් කිරීම. | 0 | 0 | 0 |
| 31 | ඡන්ද කාඩ් සම්බන්ධ වැරදි. | 0 | 0 | 0 |
| 32 | ඡන්ද දායකයන් ප්‍රවාහනය කිරීම. | 0 | 0 | 0 |
| 33 | ඡන්ද දායකයන්ට සංග්‍රහ කිරීම. | 3 | 0 | 3 |
| 34 | ඡන්දපොළ නිළධාරීන්ට සහ කටයුතුවලට බාධා කිරීම. | 0 | 0 | 0 |
| 35 | ඡන්ද දායකයන්ට පහරදීම/පලවා හැරීම. | 0 | 0 | 0 |
| 36 | හොර ඡන්ද දැමීම සහ එයට උත්සහ කිරීම. | 0 | 0 | 0 |
| 37 | වෙනත් සිදුවීම්. | 2 | 0 | 2 |
| **අනෙකුත් මැතිවරණ නීති උල්ලංඝනයන් වල එකතුව.** | | **695** | **12** | **707** |
| **මුළු එකතුව** | | **711** | **13** | **724** |

* සඳහන් කර ඇති කාල පරාසය තුල අප වෙත සිද්ධි **707** ක් ද, මැතිවරණ/අනෙකුත් නීති උල්ලංඝනයන් **724** ක් ද වාර්තා වී ඇත. (එක් සිද්ධියක් තුළ මැතිවරණ නීති උල්ලංඝනයන් කිහිපයක් තිබිය හැක)